**මොනරාගල ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**-------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
**---------------**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 ජූනි 23 වැනි දින සභාවේ සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 **මතය**
**---------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මොනරාගල ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
-----------------------------------------

**1.3.1** **ගිණුම්කරණ අඩුපාඩු**
**--------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවට ලැබුණු දිනය හෙළිදරව් නොවූ සභාව සතු පැරණි ගිනි නිවන රථයේ පිරිවැය හෝ සාධාරණ අගය හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදල් ශේෂය රු. 2,813,108 ක් වුවත් එය රු. 115,478 ක් ලෙස ගිණුම් ගත කිරීමෙන් රු. 2,697,630 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සභාව සතු ඉඩම් කැබැලි 67 ක් සුදුසුකම් ලත් තක්සේරුකරුවකු ලවා තක්සේරු කර සාධාරණ වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාව සතු ඉකුත් වර්ෂවලදී ඉවත් කරන ලද රු.755,260 ක් වටිනා ගොඩනැගිලි 3ක වටිනාකම ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වාහන හා යන්ත්‍ර උපකරණ පිරිවැය හෝ සාධාරණ වටිනාකම ගිණුම් ගත කල යුතු වුවත්, සභාව සතු වාහන හා යන්ත්‍ර සූත්‍ර 4ක රක්ෂණ වටිනාකම වූ රු.28,592,202 ක ගිණුම් ගතකර තිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

------------------------

ගිණුම් විෂයන් 04 කට අදාලව මුලා ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 3,049,734 ක් වු අතර ශේෂ සහතික හා උපයෝගි ලේඛන අනුව ශේෂය රු. 2,972,026 ක් විය.

### 1.3.3 ලැබිය යුතු ගිණුම්

--------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් තිබු 1987 වර්ෂයේදි සභාව සතුව තිබු විදුලි අංශය පවරා ගැනිම වෙනුවෙන් ලංකා විදුලි බල මණ්ඩලයෙන් අයවිය යුතු රු.4,771,469 ක මුදල අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි

(ආ) 1989 හා 1990 යන වර්ෂ තුල නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකර සභාවට පවරාදී තිබු කඩ කාමර 55 බදු දීමේදි කඩ කාමර 11 කින් අයවිය යුතු කඩ කුලී මූලික තැන්පත් රු. 1,178,375 ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂ ගණනාවක සිට අය නොවී පවතින නිලධාරීන් සහ සේවකයින් 31 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු. 381,000 ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

### 1.3.4 ගෙවිය යුතු ගිණුම්

-------------------

(අ) 1989 හා 1990 යන වර්ෂ තුල නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉදිකර සභාවට ලබාදී තිබු කඩ කාමර වෙනුවෙන් ගෙවිය යුතු රු. 4,872,912 ක් නිරවුල් කිරිමට සමාලෝචිත වර්ෂයේදිද කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු හිඟ පළාත් පාලන විශ්‍රාම වැටුප් රු. 2,813,108 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 71,419,477 ක වත්කම් විෂයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණ කිරීමට නොහැකිවිය.

**1.3.6 නීති,රීති,රෙගුලාසිවලට අනුකූල නොවීම**

----------------------------------------

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | |
| | (i) 49 වගන්තිය | සැලසුම් කමිටුවේ අනුමැතියකින් තොරව විවිධ දුරකථන සමාගම් විසින් සම්ප්‍රේෂණ කුළුණු 13 ක් ඉදිකර තිබුණි. |
| | (ii) 132 (ඒ) සහ (ඔ) වගන්තිය | අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන පෙර පාසල් උපකරණ ලබාදිම වෙනුවෙන් සභා අරමුදලෙන් රු. 110,620 ක වියදමක් දරා තිබුණි. |
| (ආ) | **<u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි</u>** | |
| | මු.රෙ. 71 | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව සභාවේ අනියම් හා ආදේශක පදනම මත සේවය කළ පුස්තකාල සහායක, ක්ෂේත්‍ර කම්කරු, සෞඛ්‍ය කම්කරු, මුරකරු සහ යන්ත්‍ර ක්‍රියාකරු යන තනතුරු සඳහා සේවකයින් 18 දෙනෙකු අනුමත කාර්යය මණ්ඩලයට පිටින් ස්ථිර පත්වීම් ලබාදී තිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 20,469,473 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 15,709,693 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම රු. 4,759,780 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

---------------------

### 2.2.1 හිඟ ආදායම්

-------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.40,970,234 ක් වූ හිඟ ආදායම් අයකර ගෙන නොතිබුණි.

### 2.2.2 වරිපනම් බදු

------------

(අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද වරිපනම් බදු ආදායම රු. 12,054,315 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් ප්‍රවර්තන බදු ලෙසරැස් කර තිබුණේ රු. 2,917,066 කි. එය මුළු බිල් කළ වටිනාකමින් සියයට 24 ක් වැනි අඩු ප්‍රතිශතයක් වූ අතර ඒ අනුව වරිපනම් බදු අයවීම ඉතා අඩු මට්ටමක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.18,881,615 ක් වූ අතර වර්ෂය තුලදී එම හිඟයෙන් රු. 4,867,402 ක් අයකර ගෙන තිබුණි. ඒ අනුව අයවීමේ ප්‍රතිශතය සියයට 23 ක් වූ අතර වරිපනම් බදු හිඟය වර්ෂයක් පාසා ඉහල ගොස් තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට රු. 10,000 වැඩි හිඟ ශේෂයක් පවතින වරිපනම් බදු ඒකක 447 න් අයවිය යුතු රු. 9,093,887 ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 බදු කුලී

--------

(අ) 2010 සහ 2013 වර්ෂවලදි අංක 24 දරන ගවමස් කඩය බදු දීමෙන් ලැබිය යුතු හිඟ බදු මුදල් පිළිවෙලින් රු. 228,613 ක් හා රු. 1,137,132 ක් අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ විධිවිධාන අනුව සභාව සතු කඩ කාමර 140 ක කුලි තක්සේරු කිරිමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,131,182 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.2,416,692 ක් අයවිය යුතුව තිබුණි.

## 2.2.5 වෙනත් ආදායම්

-----------------

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය හා 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති කර ඇති හෝටල්/ ලැගුම්හල්වලින් අදාළ වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම් වලින් සියයට එක නොඉක්මවන ගාස්තුවක් අතුරුව්‍යවස්ථා පනවා පළාත් පාලන ආයතන විසින් අයකර ගත යුතු වුවද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන හෝටල්/ ලැගුම්හල් තුනකින් එසේ ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ විධිවිධාන අනුව සභා බල ප්‍රදේශයේ විවිධ දුරකථන සමාගම් විසින් 2004 සිට 2012 වර්ෂය දක්වා ඉදිකර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 13 කින් වාර්ෂික බද්දක් අය කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

## 2.3 අධිභාර

---------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුළදී පනවන ලද අධිභාර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.922,195 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත සඳහන් කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) තනතුරු 7 කට අදාලව අනුමත සේවක සංඛ්‍යාවට වඩා සේවකයින් 20 දෙනෙකු සේවයේ යොදවා තුබුණි.

(ආ) 2013 නොවැම්බර් 20 දින පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලද ලීටර් 20 ප්ලාස්ටික් කසල බඳුන් 800 න් වටිනාකම රු. 207,828 ක් වූ කසල බඳුන් 753 ක් අලෙවි කිරිමට 2016 අප්‍රේල් 28 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 09 දින පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් අඩු ආදායම්ලාභි පවුල් වෙත බෙදාදිමට ලබා දුන් ප්ලාස්ටික් කසල බඳුන් 60 ක් බෙදා දීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විදුලිබල අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති ලිපියේ 2 (1) වගන්තිය ප්‍රකාරව වීථි ලාම්පු ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත පළාත් පාලන ආයතන වීථි පහන් ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා සේවා සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කළ යුතු වුවත්, එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා සභා අරමුදලෙන් රු. 991,005 ක වියදමක් දරා තිබුණි.

(ඉ) හිටපු ප්‍රාදේශීය සභා සභිකයින් දෙදෙනෙකුට නිකුත් කරන ලද ගැල්වනයිස් බට 32 ක් 2016 අප්‍රේල් 27 දින වන විටත් ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

**නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

සභාවට ලැබී තිබූ බැකෝලෝඩරය යුටෝන් මාර්ග තලනය භාවිතයට නොගෙන සභා භූමියේ ගාල් කර තිබුණි.

**4. යහපාලනය සහ ගිණුම් කටයුතු භාවය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම්, වියදම් හා වර්ෂයේ තථ්‍ය ආදායම්,වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

**4.3 අභ්‍යන්තර විගණනය**

පළාත් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.4 විගණන හා කළමනාකරණ කමිටු**

2009 ජුනි 9 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක කළමනාකරණ විගණන චක්‍රලේඛ DMA/ 2009 (01) දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය වන විටත් කටයුතු කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලනය**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය